## කොවිඩ්-19 ගැන ඔබ දැනගත යුතු දෑ

- නව කොරෝනා වෛරසය ආසාදිත පුද්ගලයකුගෙන් නිරෝගී පුද්ගලයෙකුට පැතිරිය හැකි රෝගයකි
- වෛරසය පැතිරෙන්නේ රෝගියකුගේ ස්වසන බිඳිති (කෙල, සොටු) මඟිනි

**පැතිරෙන ආකාරය**

- ආසාදිත පුද්ගලයින් සමඟ සෘජුව සම්බන්ධතා පැවැත්වීම
- වෛරසය මගින් අපවිත්‍ර වූ පෘෂ්ඨ ස්පර්ශ කිරීම

**රෝග ලක්ෂණ**

උණ, වියලි කැස්ස, උගුරේ වේදනාව, ස්වසන අපහසුතා

**රෝගය බෝවීම වළක්වා ගත හැකි ආකාරය**

- සෑමවිටම පුද්ගල දුරස්ථභාවය (මීටරයක්) පවත්වා ගැනීම
- නිතර නිතර සබන් යොදා හොඳින් දෑත් සෝදා ගැනීම
- අනවශ්‍ය ලෙස බාහිර පෘෂ්ඨ අතපත ගෑමෙන් වැළකීම
- අනවශ්‍ය ලෙස මුහුණ ඇල්ලීමෙන් වැළකීම
- කහින විටදී සහ කිවිසුම් යාමේදී වැලමිටෙහි ඇතුල්පැත්තෙන් නාසය සහ මුඛය ආවරණය කරගැනීම
- තැන තැන කෙළ ගැසීමෙන් හා සොටු සූරා දැමීමෙන් වැළකීම
- නිවැරදි ආකාරයට මුව ආවරණ පැළඳීම




## අවශ්‍යවිටක දී ඇමතීමට තබා ගතයුතු දුරකතන අංක

- පන්තිභාර ගුරුතුමා/තුමියගේ
- විදුහල්පතිතුමා/තුමියගේ හෝ පාසලේ
- ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතුමා/තුමියගේ
- මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරිතුමාගේ

### මෙම නව ජීවන රටාවට හැඩ ගැසීමට ඔබේ දරුවාට ආදරය සහ උපකාරය ලබා දෙන්න



**ඕනෑම සෞඛ්‍ය ගැටලුවකට දවසේ පැය 24 පුරාම භාෂා තුනෙන්ම ක්‍රියාත්මක සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ 1999 සුවසැරිය දුරකතන සේවය අමතා සුදුසුකම්ලත් වෛද්‍යරයෙකුගෙන් උපදෙස් ලබාගත හැකිය**

සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය සේවා
අමාත්‍යංශය

# කොවිඩ් 19 ගැන

## දැනගන්න
## දිරිදෙන්න
## ජයගන්න



## දරුවා පාසැල් යැවීමට පෙර පුරුදු පුහුණු කළ යුතු දෑ

- නිවැරදිව මුව ආවරණයක් පැළඳිමට
- මතුපිට පෘෂ්ඨයන් ඇල්ලීමෙන් වැළකීමට
- භාවිතා කළ ටිෂු කඩදාසි නිසි ලෙස බැහැර කිරීමට
- අසනීප තත්ත්ව පිළිබඳ තොරතුරු නිවැරදිව පැවසීමට
- මිතුරන් සමඟ පුද්ගල දුරස්ථභාවය තබාගෙන කටයුතු කිරීමට
- මිතුරන් සමඟ උපකරණ හුවමාරු කර ගැනීමකින් තොරව සෙල්ලම් කිරීමට
- මෙම රෝගය වැළඳී ඇති කෙනෙකුන්ව කොන් කිරීමට හෝ සමච්චලයට භාජනය කිරීම නුසුදුසු බව

**ඔබේ දරුවාට හෝ නිවසේ අයෙකුට හෝ**
**උණ, කැස්ස, හෙම්බිරිස්සාව**
**වැනි රෝග ලක්ෂණ ඇතිනම්**
**දරුවා පාසැල් යැවීමෙන් වළකින්න**

**ඒ ගැන පන්තිභාර ගුරුතුමා/තුමිය දැනුවත් කරන්න**
**නොපමාව වෛද්‍ය උපදෙස් ලබා ගන්න**



## දරුවා පාසල් යැවීමට පෙර සුදානම් විය යුතු ආකාරය

- සේදිය හැකි මුව ආවරණ තුනක් වත් පිළියෙළ කර දෙන්න
- කහින විටදී හෝ කිවිසන විටදී හෝ භාවිතයට අවශ්‍ය ටිෂු කඩදාසි සපයා දෙන්න
- ඔබේ දරුවා දීර්ඝ කාලීන රෝගවලින් පෙළෙන හෝ දීර්ඝ කාලීන ඖෂධ ලබාගන්නා අයෙකු නම්, වෛද්‍යවරයෙකුගෙන් උපදෙස් ලබා ගන්න
- පාසලට නැවත  යැවීමට පෙර ඒ බව පන්තිභාර ගුරුතුමාට/තුමියට දැනුම් දෙන්න



## උදෑසන දරුවා පාසැලට යැවීමේ දී

- හැකි සෑම විටම තමාගේ  වාහනයකින්/බයිසිකලයකින් පාසැල වෙත දරුවා රැගෙන යන්න
- පාසැල නිවසට ආසන්නයේ නම් පා ගමනින් යාමට යොමුකරවන්න
- පොදු ප්‍රවාහන සේවාවක් භාවිතා කරන්නේ නම්, සෞඛ්‍යාරක්ෂිතව පුද්ගල දුරස්ථභාවය රැකෙන ලෙස ගමන් කිරීමට උනන්දු කරවන්න



## දරුවා පාසල් යැවීමේදී සූදානම්ව සිටිය යුතු ආකාරය

- සෝදාගත් ඇඳුමකින් සැරසී සිටීම
- අවශ්‍ය පොත් පත් පමණක් රැගෙන තිබීම
- නිවැරදිව මුව ආවරණය පැළඳ සිටීම

## පාසැල නිමවී පැමිණි පසු නිවසට ඇතුලු වීමට පෙර

- සපත්තු ගලවා අව්වේ වේලීමට තබන්න
- පොත් බෑගය සහ උපකරණ වෙනම ස්ථානයක තබන්න
- දෑත් සබන් යොදා තත්පර 20 ක් වත් හොඳින් සෝදන්න
- ස්නානය කර ශරීරය පිරිසිදු කර ගන්න
- ඇඳ සිටි ඇදුම්, මුව ආවරණ සබන් යොදා විනාඩි 20ක් පෙඟෙන්නට හැර සෝදා අව්වේ වියලා පිරිසිදු කර ගන්න
- භාවිතා කළ ටිෂු කඩදාසි පියනක් සහිත කසල බදුනකට බැහැර කරන්න

